23 A

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පෝෂ්‍ය විධායක සේවා ගණයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන :

1.1 දෙපාර්තමේන්තුව : වනජීවී සංරක්ෂණ

යොමු අංකය : වජී/1/26/අති.අ.ජ.(මෙහෙයුම්).බ.ගැ. දිනය : 2025.01.16

1.2 අමාත්‍යාංශය : පරිසර

යොමු අංකය : MWFRC/ADM/WL/08/03/06 දිනය : 2025.01.22

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :

යොමු අංකය : DMS/1130 Vol-VI දිනය : 2024.04.29

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :

යොමු අංකය : EST-2/03/REC/7120 දිනය: 2024.12.31

යොමු අංකය : EST-02/03/REC/7120 දිනය: 2025.08.07

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : දිනය:

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

යොමු අංකය : PSC/EST/03-01-30/02/2025 දිනය:2025.06.16

02. පත්කිරීමේ බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1. සේවා ගණය : පෝෂ්‍ය විධායක

3.2. ශ්‍රේණිය : විශේෂ

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

අභිමතානුසාරී බලය හිමිවන්නා වූද, ප්‍රතිපත්ති සම්පාදනය, විධානය හා තීරණ ගැනීමේ කාර්යයට සෘජුවම ඇතුලත් වන්නා වූද, කාර්යභාරයක් පැවරෙන සේවා ගණයකි.

04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : SL 3-2025

5.2 මාසික වැටුප් පරිමාණය : රු.156,000–12 x 4,850–214,200

nd

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 01 | 156,000/- |

සටහන : වැටුප් ගෙවීම හා අදාළ අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව සහ එම තනතුරුවලට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්) | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය (විශේෂ ශ්‍රේණිය) | 01 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය හා නියාමනය, සමුද්‍ර සංරක්ෂණය හා නියාමනය, වනජීවී සංරක්ෂණ මෙහෙයුම් කටයුතු හා වනජීවී සංරක්ෂණයට අදාල සැලසුම් නියාමනය, නීති ක්‍රියාත්මක කිරීම් කටයුතු අධීක්ෂණය, සංචාරක සේවා කළමනාකරණය හා නියාමනය, වනඅලි සංරක්ෂණය හා ජීවී විශේෂ සංරක්ෂණය සඳහා විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා නියාමනය, සංරක්ෂණ කාර්යය සඳහා ධාරිතා වර්ධන කටයුතු, සංරක්ෂණයට අදාළ තොරතුරු තාක්ෂණ කටයුතු අධීක්ෂණය හා නියාමනය හා ජෛව විවිධත්ව සංරක්ෂණයට අදාල පර්යේෂණ අධීක්ෂණය මග පෙන්වීම හා නියාමනය. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(මෙහෙයුම්) - 01

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම :

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව වන අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වන හෝ වනජීවී කළමනාකරණ හෝ පරිසර කළමනාකරණ හෝ ස්වභාවික සම්පත් කළමනාකරණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.3 පළපුරුද්ද :

I. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.

II. උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක ශ්‍රේණියේ වසර 18 කට නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.4.2.4 කායික සුදුසුකම් :

I. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

II. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

I. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

II. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.4.1 සිට 7.4.3 දක්වා වූ සියලුම සුදුසුකම් බඳවා ගන්නා දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 වයස : අදාළ නොවේ.

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.4.4 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨතාවය | 50 | අදාළ නොවේ |
| කුසලතාවය | 50 | |
| එකතුව | 100 | |

සටහන -

1. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර අයදුම්පත් කැඳවීමේ නිවේදනයට ඇතුළත් කර ප්‍රසිද්ධ කරනු ලැබේ.
2. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලද මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

7.4.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම් හෝ අභ්‍යන්තර නිවේදනයක් හා වෙබ් අඩවියේ පල කිරීම මගින්

08 කාර්යක්ෂමතා කඩඉම් : අදාළ නොවේ.

09. භාෂා ප්‍රවීණතාව : අදාළ නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ.

11. තනතුරුවලට පත්කිරීම : විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබූ නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරට පත් කරනු ලැබේ.

11.1 සුදුසුකම් :

| තනතුර | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වීම. | යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් |

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ : අදාළ නොවේ

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 29/2310 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

| | |
|---|---|
| සකස් කළේ :........................................ | පරීක්ෂා කළේ :........................................ |
| අත්සන :........................................ | අත්සන :........................................ |
| (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) |
| නම :........................................ | නම :........................................ |
| තනතුර :........................................ | තනතුර :........................................ |
| දිනය : 2025/09/15 | දිනය : 2025/09/ |

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ශ්‍රේණියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්) තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :........................................ එම්.එස්.එල්.ආර්.පී. මාරසිංහ

තනතුර :........................................ අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 2025/09/16

නිල මුද්‍රාව :........................................ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, අංක. 811/ඒ, ජයන්තිපුර පාර, බත්තරමුල්ල.

23 (1)

18. අමාත්‍යාංශ නිර්දේශය :

යොමු අංකය : MWFRC/ADM/WL/08/03/06-වෙළුම I

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙ හි ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ශ්‍රේණියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : ..............................

ලේකම්

පරිසර අමාත්‍යාංශය

කේ. ආර්. උඩුවාවල
ලේකම්
පරිසර අමාත්‍යාංශය
අංක:07, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

දිනය :........................ නිල මුද්‍රාව :..........................

19. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

යොමු අංකය : PSC/EST/03-01-30/02/2025

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ ජ්‍යෙෂ්ඨ විධායක සේවා ශ්‍රේණියේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (මෙහෙයුම්) තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2025.06.16 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන :..............................

නම : ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2025.12.18 නිල මුද්‍රාව :..........................

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල